# පොදු තොරතුරු

**CTS පාඨමාලා:**

- CTS නියමානුකූල පාඨමාලාවක් සාමාන්‍යයෙන් පවත්වන්නේ සතියකට පන්තියක් බැගින් සති 13ක කාලයක් පුරාය.
- කෙටිකාලීන පාඨමාලා සම්පූර්ණ දින 4ක් පුරා පැවැත්වෙන කඩිනම් අධ්‍යයන පාඨමාලා වේ.
- බොහෝ පාඨමාලාවන්හි පන්තිය තුළ ගත කරන කාලයේ එකතුව පැය 30ක් වුවත් ඇතැම් ඒවායේ පැය 45ක මුළු එකතුවක් තිබිය හැකිය. එසේ නැතහොත් පැය 30ක පන්ති කාමර කාලයක්ද පැය 15ක ප්‍රායෝගික ක්‍රියාකාරකම් කාලයක්ද ඇත.

**පාඨමාලා දේශන පැවැත්වීම:**

- **පන්ති කාමරය තුළ:** පාඨමාලාව CTS කොහුවල පරිශ්‍රයේදී හෝ උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ ඉගැන්වේ.
- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.
- **මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය:** පාඨමාලාව පන්ති කාමරය තුළ හා අන්තර්ජාලය හරහා ඉගැන්වේ. ඇතැම් සතිවල ඔබගේ පන්තිය CTS කොහුවල පරිශ්‍රයේදී පැවැත්වෙන අතර අනෙක් සතිවල අන්තර්ජාලය හරහා ඉගැන්වෙනු ඇත. සැලැස්ම පිළිබඳ ඔබගේ කථිකාචාර්යවරයා පාඨමාලාව ආරම්භයේදී ඔබට දැනුම් දෙනු ඇත.

**CTS පාඨමාලා ගාස්තු:**

පාඨමාලාවක් හඳුන්වාදීමේ ගාස්තුව රු. 7500/- කි.

** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා සහනදායි මිලකට සිසුන්ට සැපයීමට හැකිව ඇත්තේ එය සේවයේ මිතුරන්ගේ නොමසුරු මූල්‍ය පරිත්‍යාගශීලිත්වය නිසා බැව් අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. මෙම සුවිශේෂී සැපයුමේ යහපත් ගබඩාකරුවන් වීම සිසුන්ගෙන් අපේක්ෂා කෙරේ.*

**පාඨමාලා සඳහා CTSහි ලියාපදිංචි වන ආකාරය:**

ලියාපදිංචි වීමේ අයදුම් පත registration.cts.lk සම්පූර්ණ කරන්න. ගෙවීම් අන්තර්ජාලය හරහා https://www.cts.lk/payment/, බැංකු හුවමාරු තුළින්, හෝ ක්‍රෙඩිට් කාඩ් තුළින් කළ හැකිය.
***සැලකිය යුතුයි:*** *පන්තියක ඔබගේ ස්ථානය වෙන්කරනු ලබන්නේ ඔබ පාඨමාලාව සඳහා සම්පූර්ණ ගෙවීම කළ පසුවය.*

**වැදගත්:** පළමු වරට පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වන්නන් ඔබගේ සභාපාලකතුමාගෙන් නිර්දේශ ලිපියක් රැගෙන ආ යුතුය.

**ලියාපදිංචි විය හැකි දින හා වේලාවන්:**

යම් වාරයක පාඨමාලා සඳහා ලියාපදිංචි විය හැක්කේ එම වාරය ආරම්භ වන දින දක්වා පමණි.

***පළමු වාරය: 2026 ජනවාරි 5***
***දෙවන වාරය: 2026 මැයි 5***
***තෙවන වාරය: 2026 අගෝස්තු 31***